"මඟුලට පස්සේ පුතාගේ මනාලිය දැක්ක නැන්දම්මාට තරු පෙනිලා" යන සිරස්තලයෙන් යුතුව, ලංකාදීප (01/10) 'දෙයියෝ සාක්කි' තීරුවේ පළවූ පුවත් වාර්තාවකි.

එහි සඳහන් වී තිබුණේ, මනාලිය "එතරම් රූමත් එකියක් නොවූ නිසා" පුතා දෙමාපියන්ට නොදන්වා විවාහ වූ බවත්, කෙසේ නමුත් විවාහයට ගිය මනාලයාගේ මව, "මංගල්‍ය දිනයේ මනාලිය මනා හැඩැති රන්වන් පැහැයෙන් යුත්" අයෙකු වීම නිසා බොහෝ සතුටට පත්වූ බවත්, පසු දිනයේ "[මනාලියගේ] වියපත් කළු පැහැති මුහුණ නිසා මවට ලේලියව හඳුනා ගැනීමට නොහැකි වූ බවත් වේ.

1) කළු පැහැය අවලස්සන බවටත්, රන්වන්/පැහැපත් පෙනුම ලස්සන බවටත් වන පසුගාමී, අගතිකාරී ආකල්ප, තවදුරටත් සමාජය තුළ ප්‍රවර්ධනය වීමක්, මෙවැනි පුවත් ඔස්සේ සිදුවෙතැයි ඔබ සිතන්නේ ද?

2) බාහිර රූපය අනුව සිදුකෙරෙනා කොන් කිරීම් ප්‍රවර්ධනය කිරීමක්, මෙම පුවත ඔස්සේ සිදුවෙතැයි ඔබ නොසිතන්නේ ද?